② ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 1854/44 - 2014 මාර්තු මස 21 වැනි සිකුරාදා - 2014.03.21
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1992 අංක 59 දරන සත්ව රෝග පනත

සත්ව රෝග පනතේ 5(1) වැනි වගන්තිය යටතේ නිකුත් කර, 2014.03.07 දාතමින් යුතු අංක 1852/74 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයෙන් පනවන ලද තහනම ඉවත් කිරීම පිළිබඳව විධානය

1992 අංක 59 දරන සත්ව රෝග පනතේ 5(1) වගන්තිය යටතේ නිකුත් කර, 2014.03.07 දාතමින් යුතු අංක 1852/74 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයෙන් කුර හා මුඛ රෝග ආසාදිත ප්‍රදේශයක් බවට පත් කරන ලද බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල, බියගම, දොම්පෙ, දිවුලපිටිය, ගම්පහ, කඩවත, කටාන, මරඳගහමුල, මිනුවන්ගොඩ, මීරිගම, මීගමුව යන රජයේ පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාසවලින්, ගත වූ සති තුනක කාලයක දී, අලුතින් කුර හා මුඛ රෝග ආසාදිත සතුන් පිළිබඳ තොරතුරු ලැබී නොමැති බැවින්,

1. මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි —

   (1) සත්ව රෝග පනතේ 5(1) වගන්තිය යටතේ නිකුත් කර, 2014.03.07 දාතමින් යුතු අංක 1852/74 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයෙන් පනවන ලද තහනම, ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල, බියගම, දොම්පෙ, දිවුලපිටිය, ගම්පහ, කඩවත, කටාන, මරඳගහමුල, මිනුවන්ගොඩ, මීරිගම, මීගමුව යන රජයේ පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාසවලට අදාළ නොවිය යුතු බව ද,

   (2) ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල, බියගම, දොම්පෙ, දිවුලපිටිය, ගම්පහ, කඩවත, කටාන, මරඳගහමුල, මිනුවන්ගොඩ, මීරිගම, මීගමුව යන රජයේ පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාසවල සත්ව ඝාතනය හා සත්ව වර්ගයේ මස් හා මළකුණු ආදී විකිණීම, විකිණීමට ප්‍රදර්ශනය කිරීම, ගබඩා කිරීම, සැපයීම, බෙදාහැරීම හා ප්‍රවාහනය කිරීම මෙම නිවේදනයේ උපලේඛනයේ සඳහන් කොන්දේසිවලට යටත් ව සිදු කළ යුතු බව ද,

   (3) බලයලත් පශු වෛද්‍ය නිලධාරියෙකුගේ ලිඛිත අනුමැතියකින් තොර ව, උක්ත පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාසවලින් සතුන්, මස්, මළකුණු, සතුන්ගේ මළමුත්‍රාදිය, හෝ අතුරුණුව ඉවත් නොකළ යුතු බව ද,

මෙයින් නියෝග කරමි.

1A - PG 2004 — 310 (2014/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. උක්ත ප්‍රදේශවලින් කුර හා මුඛ රෝග පැතිරීයාම වැළැක්වීම සඳහා —

(1) 1992 අංක 59 දරන සත්ව රෝග පනතේ 38 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, පහත සඳහන් නිළධාරීන්, එම පනතේ 3(2) වගන්තියේ කාර්යය සඳහා බලයලත් නිළධාරින් ලෙස කටයුතු කළ යුතු බව ද,

- අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය)
- නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය)
- සහකාර අධ්‍යක්ෂ (පශු අණපනත් කටයුතු හා සත්ව සුභසාධනය)
- පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)
- දිස්ත්‍රික් පශු වෛද්‍ය නිළධාරී, ගම්පහ දිස්ත්‍රික්කය
- අත්තනගල්ල, බියගම, දොම්පෙ, දිවුලපිටිය, ගම්පහ, කඩවත, කටාන, මරදගහමුල, මිනුවන්ගොඩ, මීරිගම, මීගමුව යන රජයේ පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාස භාර රජයේ පශු වෛද්‍ය නිලධාරීන්
- අදාළ රජයේ පශු වෛද්‍ය නිලධාරී කාර්යාලවලට අනුයුක්ත සත්ව සංවර්ධන උපදේශකවරුන්
- ශ්‍රී ලංකා පොලිසියේ සියලු ම පොලිස් නිලධාරීන්.

(2) එම සත්ව රෝග පනතේ 3(2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, මෙම නිවේදනයේ 1 වැනි වගන්තියේ සඳහන් නියෝගය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සෑම බලයලත් නිලධාරි ම අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු බව ද, ඒ සඳහා එම පනතේ 13 වැනි වගන්තියේ සඳහන් බලයලත් නිලධාරියකුගේ බලතල හා කාර්යභාර ක්‍රියාත්මක කළ හැකි බව ද,

මෙයින් නියම කරමි.

3. මෙම නිවේදනයේ —

(1) සතා යන්නට එළ ගවයෙක්, මී ගවයෙකු, බැටළුවෙකු, එළුවෙකු, හෝ ඌරෙකු අදහස් වේ.

(2) බලයලත් පශු වෛද්‍ය නිලධාරි යන්නට,

- අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය)
- නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය)
- සහකාර අධ්‍යක්ෂ (පශු අණපනත් කටයුතු හා සත්ව සුභසාධනය)
- පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)
- දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරී, ගම්පහ දිස්ත්‍රික්කය
- අදාළ රජයේ පශු වෛද්‍ය නිලධාරි කොට්ඨාස භාර රජයේ පශු වෛද්‍ය නිලධාරීන් අදහස් වන්නේ ය.

4. සත්ව රෝග පනතේ 5(1) වගන්තිය යටතේ නිකුත් කර, 2014.03.07 දාතමින් යුතු අංක 1852/74 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයෙන් ගම්පහ දිස්ත්‍රික්කයට පනවන ලද පහත සඳහන් තහනම මෙයින් ඉවත් කරමි.

(1) රෝග අවදානමට ලක් ව සිටින සත්ව විශේෂ සම්බන්ධ කෘතිම අභිජනන කටයුතුවලට පනවන ලද තහනම.

(2) කිරි හා කිරි නිෂ්පාදන විකිණීම, විකිණීමට පාත්‍ර කිරීම, ගබඩා කිරීම, සැපයීම, බෙදා හැරීම සම්බන්ධව පනවන ලද තහනම.

වෛද්‍ය. ඩබ්ලිව්. කේ. ද සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

### උපලේඛනය

සත්ව ඝාතනය හා සතුන්ගේ මස් හා මළකුණු විකිණීම, විකිණීමට ප්‍රදර්ශනය කිරීම, ගබඩා කිරීම, සැපයීම, බෙදාහැරීම හෝ ප්‍රවාහනය කිරීම පිළිබඳ කොන්දේසි

1. සත්ව ඝාතනය, 1958 අංක 29 දරන සත්ව පනත, ගෝඝාතක ආඥාපනත, සත්ව හිංසා පනත, පීඩා ආඥාපනත යන පනත්වල විධිවිධාන අනුව සිදුකළ යුතු ය.

2. සතුන් ඝාතනය කළ යුත්තේ —

(1) ගෝ ඝාතක ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් හෝ 1970 අංක 31 දරන පළාත් පාලන අමාත්‍ය (බලය පැවරීම) පනත යටතේ බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කරන ලද සත්ව ඝාතනාගාරයක දී හෝ ;

(2) ගෝ ඝාතක ආඥාපනතේ 14(අ) වගන්තිය යටතේ අදාළ බලධාරියා විසින් අනුමත කරන ලද ස්ථානයක දී ; හෝ

(3) අදාල පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද පෞද්ගලික සත්ව ඝාතනාගාරයක දී පමණකි.

3. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් සෑම ස්ථානයක් සඳහා ම පහත සඳහන් බලපත්‍ර ලබා තිබිය යුතු ය.

(1) 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ හෝ පළාත් සභාවේ පරිසර පිළිබඳ ප්‍රඥප්තිය යටතේ හෝ නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ;

(2) කර්මාන්තශාලා ආඥාපනත යටතේ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය.

4. සතුන් ඝාතන කළ යුත්තේ පහත සඳහන් අයවලුන් පමණි ;

(1) ගෝ ඝාතක ආඥාපනතේ 4 වැනි වගන්තිය යටතේ හා එම ආඥාපනතේ 5, 6, 7 යන වගන්තිවල විධිවිධාන අනුව නිකුත් කරන ලද වලංගු ගෝ ඝාතක බලපත්‍ර ලාභියෙක් ;

(2) ගෝඝාතක ආඥාපනතේ 12 වගන්තිය යටතේ නිකුත් කරන ලද වලංගු තාවකාලික ගෝඝාතක බලපත්‍රලාභියෙක් ;

(3) ගෝඝාතක ආඥාපනතේ 18(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද විශේෂ ගව ඝාතන බලපත්‍ර ලාභියෙක්.

5. බලයලත් පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් පරීක්ෂා කර, නිරෝගි බවට ද කුර හා මුඛ රෝගයෙන් හෝ වෙනත් විශේෂිත රෝගවලින් තොර වූ බවට ද, ඝාතනය කිරීමට සුදුසු බවට ද සහතික කරන ලද සතුන් පමණක් ඝාතනය කළ යුතු ය. එසේ සහතික කරන ලද සෑම සතෙකු ම එම සතාගේ අයිතිකරුගේ වියදමින් කණ සලකුණු කරවා ගත යුතු ය.

6. ඝාතනය කිරීමට නියමිත සියලු ගවයන්, 1958 අංක 29 දරන සත්ව පනත යටතේ කන් සලකුණු කර තිබිය යුතු ය.

7. සතුන් ඝාතනය කළ යුත්තේ බලයලත් පශු වෛද්‍ය නිලධාරියෙකුගේ හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ය.

8. සතෙක් ඝාතනය කරනු ලබන අවස්ථාවක දී, අදාළ ගෝ ඝාතකයා විසින් පහත සඳහන් ලියවිලි, බලයලත් නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය ;

(1) ගෝ ඝාතක බලපත්‍රය ;

(2) ඝාතනය කිරීමට නියමිත සතා, ගෝ ඝාතකයාට අයිති බවට තහවුරු කරන සහතිකය හෝ වවුචර් පත ;

(3) ඝාතනය කිරීමට නියමිත සතා නිරෝගී බවට ද, කුර හා මුඛ රෝගයෙන් හෝ වෙනත් විශේෂිත රෝගවලින් තොර වූ බවට ද, බලයලත් පශු වෛද්‍ය නිලධාරියා විසින් නිකුත් කරන ලද සහතික.

9. ඝාතනය කරන ලද සතෙකුගේ මස් හෝ මළකුණු හෝ ඉන් කොටසක් හෝ, බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයකින් තොරව, සත්ව ඝාතනාගාරයකින් බැහැර නොකළ යුතු ය.

10. පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද ස්ථානවල පමණක් මස් විකිණීම, විකිණීමට ප්‍රදර්ශනය කිරීම, ගබඩා කිරීම, සැපයීම, බෙදාහැරීම සිදු කළ යුතු ය.

11. බලයලත් පශු වෛද්‍ය නිලධාරියා විසින් අනුමත කරන ලද මස් පමණක් ඉහත 10 වගන්තියේ සඳහන් ස්ථානවල විකිණීමට, විකිණීමට ප්‍රදර්ශනය කිරීමට, ගබඩා කිරීමට, සැපයීමට හෝ බෙදාහැරීමට තිබිය යුතු ය.

12. මස් හෝ මළකුණු ප්‍රවාහනය කිරීම සඳහා බලයලත් පශු වෛද්‍ය නිලධාරියා විසින් අනුමත කරන ලද වාහන පමණක් යෙදවිය යුතුය.

13. බලයලත් පශු වෛද්‍ය නිලධාරියා විසින් නිසි පරිදි අනුමත කරන ලද මස් හෝ මළකුණු පමණක් ප්‍රවාහනය කළ යුතු ය.

04 - 183

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.